# පෙරවදන

බරවා රෝගයේ සමාජ ආර්ථික හා පාරිසරික නිර්නායකවල ක්ෂේත්‍රීය රටා පිළිබඳව කරන ලද විශ්ලේෂනාත්මක නිබන්ධය මාතර රුහුණ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන්නෙමි.

ලෝකයේ බොහෝ රටවල් තුළ පැතිර ඇති වසංගත රෝග අතර බරවා රෝගයට විශේෂ තැනක් හිමි වෙයි. ශ්‍රී ලංකාවේද නිරිත දිග වෙරළ බඩ තීරුවේ එනම් පුත්තලමේ සිට කතරගම දක්වා පහත් තැනිතලා තීරුවේ බරවා රෝගය බෙහෙවින් පැතිර තිබේ. එපමණක් නො ව එය දැනට ක්‍රමයෙන් දිවයිනේ අභ්‍යන්තර ප්‍රදේශ කරාද ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර තිබේ. බලවත් සමාජ උවදුරක් වූ මේ රෝගය පැතිරීමට ඉවහල් වී ඇති සමාජ ආර්ථික හා පාරිසරික සාධක පිළිබඳ ව පෘථුල විශ්ලේෂණයක් කිරීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. මෙහි අන්තර්ගත වන්නේ ඒ සඳහා දරන ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයයි.

බරවා රෝගය නගර ආශ්‍රිතව වැඩි පැතිරීමක් ඇති නිසා මාතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර දෙකක් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. මේ නගර දෙකේ ම රෝග කාරක හේතු බොහෝ සෙයින් සමාන වූ බව සමීක්ෂණ කටයුතු වලදී පැහැදිලි විය. එමෙන් ම රෝගයේ පැතිරීම කෙරෙහි භෞතික පාරිසරික සාධකවලටත් වඩා මානව පාරිසරික සාධකවල බලපෑම දැඩි ලෙස හේතු වී ඇති බවද එහිදී අනාවරණය විය.

පර්යේෂණය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ සිට අවසානය තෙක් මා හට ගුරුපදේශ සපයමින් මා දිරිමත් කළ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය කාන්ති රත්නායක මහත්මියටත්, නිබන්ධයේ හැම ගැටළු අවස්ථාවකදීම වඩාත් විධිමත් ලෙස නිබන්ධය සම්පාදනය කිරීමට උපදෙස් දෙමින්ද, ස්වකීය වටිනා කාලය වැය කළ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්. රත්නායක මහතාටත්, භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. හේවගේ මහතා ඇතුළු දයාබර ආචාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය හිමි වෙයි.

රුහුණ විශ්ව විද්‍යාලය
30-5-1995
පුස්තකාලය - මාතර

එසේම අධ්‍යයන ක්ෂේත්‍රය තුළ බරවා රෝගයෙන් දැඩි පීඩා විඳිමින් සිටි නිවැසියන් අතරට ගොස් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදී ඔවුන් මා කෙරෙහි දක්වන ලද කාරුණික සහයෝගයට කෘතඥතාව පල කිරීමට ප්‍රමාණවත් වදන් වැලක් මා සතුව නැත. එමෙන් ම මාගේ ක්ෂේත්‍රීය කටයුතුවලට නිරන්තරව සහාය දුන් ඩී.එදිරිසිංහ, ඊ.ඒ.එදිරිසිංහ ඇතුළු සහෝදරවරුන්ටද, අදාළ ප්‍රදේශවල බරවා රෝග ක්ෂේත්‍ර නිලධාරී චන්ද්‍රපාල එදිරිසිංහ මහතාට සහ ග්‍රාම නිලධාරී මහත්වරුන්ට ද මගේ ස්තූතිය එහිලා පිරිනැමෙයි. එමෙන් ම මූලික දත්ත ලබා ගැනීමේ දී සහාය දුන් බරවා රෝග මර්දන මූලස්ථානයේ අධ්‍යක්ෂ ලලිත් සී මෙන්ඩිස් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ද, මාතර බරවා රෝග මර්දන ඒකකයේ වෛද්‍යාචාරිනී විජේගුණවර්ධන මහත්මියට සහ සෝමපාල පටබැඳි මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තූතිය පිරි නැමේ.

එමෙන් ම පේරාදෙනිය සරසවියේ වෛද්‍ය පීඨයේ අවසන් වසරේ පී.එදිරිසිංහ සොහොයුරාත්, එම පුස්තකාලයාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාගේ සමීක්ෂණ කටයුතුවල නිරතව ක්ෂේත්‍රීය අධ්‍යයනයන් වල සිට නිබන්ධය අවසානය තෙක් මා සමීපව කටයුතු කළ මා දයාබර ඩී.ඒ.මෙන්ඩිස් මහතාටත්, ව්‍යාකරණ නිවැරදි කිරීම් පෙන්වා දෙමින් සහාය දුන් සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.ධම්මින්ද ස්වාමීන් වහන්සේටත්, යතුරු ලියන කටයුතු සාර්ථක ව නිම කර දුන් ඥානා වෛද්‍යගේ මහත්මියටත්, මගේ සෙනෙහෙබර ස්තූතිය පුද කරමි.